Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - සිංහල

සතිය- සැප්තැම්බර් 1

ශ්‍රේණිය - 10

සැකසුම - එන්.පී. ප්‍රේමලතා මිය. ගුරු උපදේශක (සිංහල) දෙහිඕවිට අධ්‍යාපන කලාපය

සිංහල භාෂාව හා සාහිත්‍යය

# 18 පාඩම - ආපදා කළමනාකරණය.

## ➢ ඉගෙනුම් ඵල -

- නියමිත පාඩම කියවයි.
- දෙන ලද නිර්ණායකයනට අදාළ කරුණු ලකුණු කරයි.
- ක්‍රියාකාරකම් සඳහා පෙළඹෙයි.

1. පහත දැක්වෙන එක් එක් ආපදා සඳහා නිදසුන් ලියන්න .

I. දේශගුණික ආපදා
......................................................................................................
......................................................................................................

II. භූභෞතික හා විද්‍යාත්මක ආපදා
......................................................................................................
......................................................................................................

III. කාර්මික ආපදා
......................................................................................................
......................................................................................................

IV. ප්‍රවාහන ආපදා
......................................................................................................
......................................................................................................

V. විවිධ ආපදා
......................................................................................................
......................................................................................................

2. ආපදා අවස්ථාවක බෙදෙන කොටස් තුන නම් කරන්න.

I. ............................................................................

I. ............................................................................

II. ............................................................................

# 4 පාඩම - බැද්දේගම

## ➢ ඉගෙනුම් ඵල -

- අදාළ පාඩම කියවයි.
- චරිත හඳුනා ගනියි.
- චරිත ලක්ෂණ සඳහා නිදසුන් සපයයි.

1. පහත 1 කොටසේ දැක්වෙන පුංචිමැණිකාගේ චරිතය හා සම්බන්ධ ලක්ෂණය සමග ගැළපෙන ප්‍රකාශය 2 කොටසින් තෝරා එහි අංකය අදාළ තිත් ඉරමත ලියන්න. එක් එක් ප්‍රකාශයට අදාළ උද්ධෘතයක් ද පාඩමෙන් තෝරන්න.

I කොටස

I. නිහතමානී ගති පැවතුම් ඇති බව. (............)
II. පියාගේ හා සැමියාගේ වියෝවෙන් කම්පනයට පත් වීම. (............)
III. ජීවන අරගලය ජය ගැනීමට ඇය තුළ වූ ධෛර්යය. (............)
IV. ස්වාමියා පිළිබඳ වූ අසීමිත විශ්වාසය හා ආරක්ෂාව. (............)
V. අභියෝගවලට මුහුණ දීමේ ආත්ම ශක්තිය. (............)
VI. ගැමි බිරිඳක සතු ස්වාමි භක්තිය. (............)
VII. දැඩි දුකක් වුව ද දරා ගැනීමේ හැකියාව. (............)

II කොටස

I. බබුන් ආපසු එතැයි යන අපේක්ෂාවෙන් දවස පටන් ගැනීම බබුන් හමුවෙතැයි යන හැඟීමෙන් කඹුරු පිටියට වැටී ඇති පාරේ ටික දුරක් ගමන් කිරීම පුංචිරාළ ඇතුළු ගැමියන්ගෙන් බබුන් ගැන විමසීම.

II. පුංචිරාළ මෙන්ම හිරපල්ලා ද බබුන් මියගොස් ඇතැයි යනුවෙන් කළ ප්‍රකාශය හමුවේ කම්පාවට පත් නොවී දුක තනිවම නිහඬව දරා ගැනීම.

III. ඇය සතු ශාන්ත හා යටහත් පහත් ගතිගුණ නිසා ගමේ කවුරුත් ඇයව ප්‍රිය කිරීම.

IV. සිළිඳු මෙන්ම බබුන් ද නොමැතිව ජීවත් වීමේ දී ඇය තුළ අනාගතය පිළිබඳ බියක් ද දුකක් ද හට ගැනීම.

V. අනෙකකු ඉදිරියේ තම සැමියාගේ නම කීමේ පුරුද්දක් ඇය කෙරෙහි නොවූයේ ඇය තුළ වූ ස්වාමි භක්තියත් ගැමි ගතියත් නිසා ය.

VI. කර්ලිනා හාමිගේත් තමාගේත් ජීවිතය නොමැරී පවත්වා ගැනීමට ඇය අපමණ වෙහෙස වී වැඩ කිරීම.

VII. ස්වාමියා ගැන ආරංචියක් දැන ගැනීම සඳහා නුහුරු නුපුරුදු මගක් ඔස්සේ හිරගෙදර සොයා යාම.